**මධ්‍යම පරිසර අධිකාරිය - 2015**

---------------------------------------

මධ්‍යම පරිසර අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටින් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

ඉකුත් වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ලෙස වර්ගීකරණය කර තිබූ වටිනාකම රු.2,450,000 ක් වූ ඉඩම් සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කර තිබුණ ද එයට අදාල රු. 428,750 ක් වූ ක්ෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන දේපළ පිරියත හා උපකරණ සෑම වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් රු.95,469,873 ක් වටිනා මෝටර් වාහන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇගයීමකින් තොරව කාර්යාල උපකරණ වෙනුවෙන් අනුගමනය කරනු ලබන පිරිවැයෙන් සියයට 10 ක් වූ වාර්ෂික ක්ෂය කිරීම් ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ ආයතන වලින් හා වෙනත් ව්‍යාපෘතිවලින් ලැබී තිබූ එකතු වටිනාකම රු.20,178,000 ක් වූ වත්කම් ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් වූ ක්ෂය ප්‍රතිපාදනයන්ද සිදුකර නොතිබුණි.

(ආ) ප්රාග්ධන ප්‍රදාන වශයෙන් ඉකුත් වර්ෂයේදී ලැබී තිබූ වටිනාකම රු. 395,200,000 ක් වූ ව්‍යාපෘති 2014 වර්ෂයේදී ප්‍රාග්ධනිත නොකිරීම නිසා එයට අදාළ රු.9,443,854 ක් වූ ක්ෂය අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ලියා හැර තිබුණි.

(ඇ) විවිධ ආයතන වලින් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.528,152,772 ක් වූ වත්කම්වල වටිනාකම මූල්‍ය චලනයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෝටර් බයිසිකල් මිලදී ගැනීම සඳහා වැයකළ රු.7,320,000 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 34,546,481 ක් වූ මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ සහ එකතුව රු. 164,361,911 ක්වූ පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු ව්‍යාපෘති වියදම් සඳහා පිළිවෙලින් විස්තරාත්මක උපලේඛන සහ බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2006 ඔක්තෝබර් 10 දිනැති අංක 1466/5 දරන ගැසට් පත්‍රය. | සණකම මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතීන් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, එම නිෂ්පාදනයන් විකිණීමට හෝ භාවිතා කිරීම තහනම් කර තිබුණද, මෙකී නියෝගයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.3 වගන්තිය හා 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආපදා ණය ගෙවීමේදී නිලධාරීන්ගේ මූලික වැටුප පදනම් කරගෙන ණය මුදල ගණනය කළ යුතු වුවද, අධිකාරිය විසින් දළ වැටුප පදනම් කරගෙන ගණනය කර ගෙවීම් කර තිබීම හේතුවෙන් නිලධාරීන් 123 දෙනෙකුට රු.17,431,997 ක් වැඩිපුර ගෙවීම් කර තිබූ අතර නිලධාරීන් 59 දෙනෙකු වෙත චක්‍රලේඛ සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | වාර්ෂිකව ස්ථාවර වත්කම් සමීක්ෂණය කර ස්ථාවර වත්කම් ලේඛනයේ ශේෂය සමඟ සැසඳිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අතිරේක දීමනා ගෙවීමේදී ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවද එයට පටහැනිව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති නිලධාරීන් 22 ක් සඳහා වැටුප් වර්ධක තුන බැගින් ලබාදී තිබුණි. |
| (ඉ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| | (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 චක්‍රලේඛය | පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ හා ඊට අදාල ව්‍යාපෘති 02 හි මූල්‍ය ප්‍රතිඵලය රු.72,318,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.61,310,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,008,000 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.86,026,000 කින් වර්ධනය වී තිබුණද මෙහෙයුම් වියදම රු.97,033,000 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණද 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී අධිකාරියේ දායකත්වය 2014 සහ 2015 වර්ෂවල පිළිවෙලින් රු.453,482 හා රු.646,565 ක් විය.

### 3.2 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

ආයතනය විසින් පරිසර දූෂණ හා පරිසර බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතන හා පුද්ගලයින්ට එරෙහිව අධිකරණවල සමාලෝචිත වර්ෂයේදී නඩු 60 ක් හා ඉකුත් වර්ෂයේ දී නඩු 116 ක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 10 වන වගන්තියට අනුව ප්‍රධාන අරමුණු පහතින් දැක්වේ.

- ❖ ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම අනතුරුදායකවීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ගවල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යෑම හා පාලනය කිරීම.

- ❖ පාරිසරික බලපෑම් ඇගයීම උපයෝගි කරගෙන ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයක් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම.

- ❖ පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගිත්වය ලබා ගැනීම. විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබා ගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම ගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම.

එම අරමුණු අතරින් පහත සඳහන් අරමුණු ඉටුකර නොතිබුණි.

(i) යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ සහ විශේෂයෙන්ම පාරිසරික දූෂණය පිළිබඳ වූ නිර්දේශ

අනුව ක්‍රියාකරන ලෙස හා ඒ නිර්දේශ බලාත්මක කරන ලෙස ඒ පළාත් පාලන ආයතනයට නියම කිරීම.

(ii) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වෙනත් රටවල් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කිරීම සහ පවත්වා ගෙනයාම.

(ආ) පිළිසරු ව්‍යාපෘතිය

----------------------

2008 – 2010 වර්ෂය දක්වා වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට සැලසුම්කර තිබූ ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු.බිලියන 5.633 ක් වෙන්කර දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.බිලියන 2.555 හෙවත් සියයට 45 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2016 මැයි අවසානය දක්වා ව්‍යාපෘතිය නිමකර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දැයට කිරුළට සමගාමීව මාතර මහ නගර සභාවේ නිර්වායු ජීර්ණ තාක්ෂණය යොදාගනිමින් ක්‍රියාත්මක වන කොටවිල කසල කළමනාකරණ ව්‍යාපෘතියට 2014 වර්ෂයේදී හා 2015 වර්ෂය ආරම්භයේදී කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රතිපාදන මුදලින් සියයට 55 ක් හෙවත් රු.64,356,000 ක් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් සමාගමට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු අතරමඟ නවතා තිබූ අතර එම ව්‍යාපෘතිය 2016 මැයි 01 දින වන විටත් නැවත ආරම්භ කර නොතිබුණි.

(ii) කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභා හතරකට හා නගර සභාවකට රු.5,552,962 ක් ලෙස අත්තිකාරම් ලබා දී තිබුණද එම ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(iii) පළාත් පාලන ආයතන 06 ක කොම්පෝස්ට් ව්‍යාපෘති මාස 05 සිට අවු 03 මාස 09 දක්වා කාල ප්‍රමාදයක් සහිතව ආරම්භ කර තිබුණි.

(iv) ව්‍යාපෘතියේ අරමුණු වලින් බැහැරව මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් සඳහා රු.1,372,000 ක් වියදම් කර තිබුණි.

(ඇ) ආර්ථික සහයෝගිතා අරමුදල් ණය පහසුකම් මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF)

---------------------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය මාස 48 කින් නිම කිරීමේ පදනම මත කොරියන් රජයෙන් හා ශ්‍රී ලංකා රජයෙන් පිළිවෙළින් ඇමරිකානු ඩොලර් 33,536,000 ක් හා ඇමරිකානු ඩොලර් 8,350,000 ක් යොදවා 2013 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. 2016 මැයි වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 මාස 05 ක කාලයක් ගතවී තිබුණද යෝජිත බිම් පිරවුම් මධ්‍යස්ථාන 04 හි ඉදිකිරීමේ කටයුතු නිමකර නොතිබුණි. මේ සඳහා 2014 වර්ෂයේ රු.143,515,900 ක් හා 2015 වර්ෂයේ රු.192,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීම සඳහා 2015 වර්ෂයේ විදේශ ණය ලෙස රු.300,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව 2015 දෙසැම්බර් 29 දින අමාත්‍යාංශයේ වෙරළ ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ සැලසුම්කරණ ව්‍යාපෘතිය සඳහා මාරුකර තිබුණි.

(iii) විදේශ මූල්‍යයනය ආශ්‍රිත දේශීය පිරිවැය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.92,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද රු.14,953,000 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 84 ක් එනම් රු.77,047,000 ක් ඌනඋපයෝජිතව පැවතුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘති පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා රු.69,500,000 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී සම්මත රේටයන්වලට වඩා වැඩියෙන් ඇස්තමේන්තු කිරීම, සිදුකර නොමැති විෂයයන් සඳහා ඇස්තමේන්තු කිරීම හා අසම්භාව්‍යයන් වෙනුවෙන් ඇස්තමේන්තු කිරීම හේතුවෙන් රු.22,266,495ක අධි ඇස්තමේන්තු කිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු.8,151,173 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද මාර්ගය ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති බව රසායනාගාර වාර්තා 05 ක් මඟින් සනාථ වී තිබුණද අධිකාරිය මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ආ) පරිසර අමාත්‍යාංශය මඟින් අධිකාරිය වෙත ලබා දී තිබුණු වාහන 06 ක් වසර තුනක් තිස්සේ අධිකාරිය විසින් භාවිත කරමින් පැවතියද එහි අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විධායක දීමනා ලෙස අධිකාරියේ නිලධාරීන්ට ගෙවා තිබූ රු.1,901,000 ක දීමනා 2016 අප්‍රේල් වන විටත් නැවත අයකර ගෙන නොතිබුණි.

(ඈ) පාරිසරික බලපෑම් තක්සේරු ව්‍යාපෘති වාර්තා අනුමත කිරීමේ කාර්ය වෙනුවෙන් ව්‍යාපෘති 21කට අදාළව ව්‍යාපෘති යෝජකගෙන් අයකරගත යුතු රු.325,339 ක පරිපාලන ගාස්තු අයකර ගෙන නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරියේ නිලධාරීන් 874 ක් සඳහා ආහාර දීමනා ලෙස දිනකට රු.85 බැගින් රු.12,902,384 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

### 4.4 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පුනරාවර්තන හා ප්‍රාග්ධන ආධාර ලෙස ව්‍යාපෘති 10 ක් සඳහා ලැබුණු රු.4,333,917 ක මුදලක් අදාල අරමුණු සඳහා යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

### 4.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් නිෂ්පාදන පරීක්ෂාව සඳහා 2007 වර්ෂයේදී රු.452,660 ක් වැය කර මිලදී ගෙන තිබූ පරීක්ෂණ උපකරණ 10 ක්, 2016 මැයි දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) වටිනාකම රු.6,050,000 ක් වූ මෝටර් වාහනයක් වසර හතරකට ආසන්න කාලයක සිට භාවිතා කිරීමකින් තොරව වාහන අංගනය තුළ නවතා තිබුණි.

**4.6 හඳුනාගන්නා ලද පාඩු**

2014 වර්ෂයේදී ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු.18,130 ක මුදලක් ගෙවා තිබූ අතර මෙම මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදී තිබූ අධිකාරියේ සම්පත්**

දොම්පේ ග්‍රීන් පාර්ක් මධ්‍යස්ථානය වෙත ලැබුණු රු.6,675,000 ක් වූ කම්පැක් වාහනයක් 2014 වර්ෂයේ සිට කඩුවෙල මහ නගර සභාවේ ප්‍රයෝජනය සඳහා අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 1173 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 874 ක් විය.

(ආ) නව බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීමකින් තොරව කාර්ය මණ්ඩල අනුමත කිරීම් හා උසස් කිරීම් වලදී නීත්‍යානුකූල පදනමකින් කටයුතු කර නොතිබුණ අතර මේ හේතුවෙන් නිසි සුදුසුකම්ලත් නිලධාරීන් පත්කර ගැනීමේ අවස්ථාව මඟහැරී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම පවත්නා බඳවාගැනීමේ පරිපාටිය තුළ එක් එක් තනතුරට අදාලව තිබිය යුතු මූලික උපාධි සහ පශ්චාත් උපාධි සුදුසුකම් හා අධිකාරිය තුළ අවුරුදු කිහිපයක සේවා පළපුරුද්ද සමාන ලෙස සලකා සුදුසුකම් තීරණය කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඇතැම් තනතුරු වල දැනට කටයුතු කරන නිලධාරීන්ගේ පවතින සුදුසුකම් ඇතුළත්කර බඳවාගැනීමේ පරිපාටිය සකස්කර තිබූ බව ද නිරීක්ෂණය විය.

**4.9 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතයෙන් ඉවත්කර ඇති වාහන 04 ක් අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) අස්ථාන ගතවූ පිරිවැය රු. 183,000 ක් වූ මෝටර් බයිසිකලයක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 31 දින දක්වාම අවසන් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයේ යෝජිත කාර්ය මණ්ඩලය අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2016 අගෝස්තු 01 දිනට නිලධාරීන් තිදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. අධිකාරියේ විෂය පථය හා සැලකීමේදී මෙම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

**5.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පරිසර පැමිණිලි 2053 ක් ලැබී තිබූ අතර ඉන් 1614 ක් හෙවත් සියයට 79 ක් විසඳීමට කටයුතු කර නොතිබූ අතර පැමිණිලි විසඳීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික ගැටළුවක්ව පවතින නගරාසන්න ප්‍රදේශ තුළ එකතු වන කසල සම්බන්ධයෙන් රට තුළ සුළු හෝ මධ්‍ය පරිමාණයෙන් යුක්තව කසළ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායන පොහොර භාවිතයට විකල්ප විසඳුමක් ලබා දීම හා පරිසර හානිය අවම කිරීමට මෙන්ම අධිකාරියට ආදායමක් ලබා ගැනීම යනාදී කරුණු සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් දැක්වීම අධිකාරිය සතු වගකීමක් වුවද ඒ සඳහා වැඩි අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිසි ක්‍රමවේදයකින් තොරව නිකුත් කිරීම හේතුකොටගෙන අධිකාරිය විසින් ජනතාවට ලබාදිය යුතු සේවාව සාර්ථකව ඉටු වී නොතිබුණි.

(ඈ) සමනළ අඩවිය රක්ෂිතය තුළ ඇලි 07 නමින් හැඳින්වෙන දිය ඇලි 07 න් 06 වන ඇල්ලට ඉහළින් අමුණක් ඉදිකර ජලය හරවා නාය ගඟ කුඩා පරිමාණ විදුලි බලාගාරය තැනීම මගින්, 06 හා 07 වන දිය ඇලි වල ජලය සිඳී යාමේ අවදානමක් ඇති බව හඳුනාගෙන තිබූ අතර ඒ පිළිබඳ ඉදිරිපත් කර තිබූ පැමිණිලි හා අවදානම් නොසලකා ඊට අදාල මූලික පාරිසරික වාර්තා ලබා දී තිබුණි. මේ වන විට ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර එකී දිය ඇලි 07 න් 02 ක් සිඳී යාමේ තර්ජනයක් පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවලින් තහවුරු කරගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) ජාතික පාරිසරික පනතේ සඳහන් අරමුණු හා ප්‍රධාන කාර්යයන් අතර පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීමට සහ පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීමට මෙන්ම වැඩිදියුණු කිරීමට අදාල සියළු විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම අධිකාරිය සතු විය. බොහෝ පළාත් පාලන ආයතන විසින් නගරාශ්‍රිතව එකතුවන කසළ අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසරයට මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධ බරපතල ගැටළුවක් වන බැවින් ඊට කඩිනමින් විසඳුම් ලබාදීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීම්, උසස්වීම්, වැටුප් වර්ධක ලබානොදීම. |
| (ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පාලනය | නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු නොකිරීම හා ව්‍යාපෘති වලට අදාල අවසන් වාර්තා හා ගිණුම් ඉදිරිපත් කර නොතිබීම. |
| (ඇ) වාහන පාලනය | භාවිතයටගත නොහැකි වාහන ඉවත් කිරීම හා කුලී වාහන ලබා ගැනීම අවම කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබීම. |